ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
**පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**

# ලංසු ආරාධනය (IFB)

## සනීපාරක්ෂක සේවා සඳහා වන ප්‍රසම්පාදනය.

## IFB No: DRP/ACC/07/20/2025-II

01. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් 10 වැනි මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලය සහ ලේඛනාගාරය, "යමුනා" ගොඩනැගිල්ල, නුගේගොඩ යන ස්ථානයන්හි **සනීපාරක්ෂක සේවා සැපයීම** සඳහා සුදුසුකම්ලත් හා යෝග්‍යතාපූර්ණ සේවා සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

02. අපේක්ෂිත සේවා කාලය **2025 නොවැම්බර් 01 සිට 2026 ඔක්තෝම්බර් 31 දක්වා**

03. මෙම ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමය අනුව සිදු කෙරේ. (NCB)

04. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට, සතියේ වැඩ කරන දිනවල **පෙ.ව. 9.00** සිට **ප.ව. 3.00** දක්වා බත්තරමුල්ල සුහුරුපාය ගොඩනැගිල්ලෙහි 12 වන මහලේ සී, පර්යන්තයේ පිහිටි පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී (ප්‍රසම්පාදන) වෙතින් දුරකථන අංක: **011-5226172** ඔස්සේ වැඩි දුර තොරතුරු ලබාගත හැකි ය. ලංසු ලේඛන **2025.08.29** සිට **2025.09.17** දින දක්වා නොමිලේ පරීක්ෂා කළ හැකි අතර, එම ලංසු ලේඛනය දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි **(www.drp.gov.lk)** පල කර ඇත.

05. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, **2025.08.29** සිට **2025.09.17** දක්වා **වැඩ කරන දිනවල පෙ.ව. 9.00** සිට **ප.ව. 3.00** දක්වා කාලය තුළ නැවත නොගෙවනු ලබන **ශ්‍රී ලංකා රුපියල් 3,500/-** ගාස්තුවක් මුදලින් ගෙවා ගණකාධිකාරී (ප්‍රසම්පාදන), පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, 12 වන මහල, සී පර්යන්තය, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය ලබා ගත හැකි ය.

06. **2025.09.18** දින **ප.ව. 2.00 හෝ ඊට පෙර**, **"මුල් පිටපත"** සහ **"අනු පිටපත"** ලෙස සටහන් කරමින් පිටපත් දෙකින් යුතු, මුද්‍රා තැබූ ලංසු වෙන වෙනම ලියුම් කවරවල බහා මෙම ලියුම් කවර දෙකම (මුල් පිටපත සහ පිටපත) එක් ලියුම් කවරයක බහා තිබිය යුතු අතර, 4 ඡේදයේ දක්වා ඇති ලිපිනයට, ලංසු ලැබෙන්නට සැලැස්විය යුතු ය, නැතහොත් **ගිණුම් අංශය, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, 12 වන මහල, සී පර්යන්තය, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල** යන ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ලංසු ඉදිරිපත් කිරීමේ අවසන් දිනයේ සිට **දින හැත්තෑ හතක (77) (2025.09.18 - 2025.12.03)** කාලයක් හෝ මිල දී ගන්නා විසින් දීර්ඝ කරන දිනයක් දක්වා ලංසු වලංගු විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම පැමිණීමට අපේක්ෂා කරන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

07. ලංසුව බහා එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ කොන්ත්‍රාත්තුවේ නම සහ ලංසු කැඳවීමේ අංකය සඳහන් කළ යුතු ය. සියලුම ලංසු ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි, ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද **ශ්‍රී ලංකා රුපියල් එක්ලක්ෂ හැත්තෑපන් දහසක (175,000/-)** ලංසු සුරක්ෂණයක් සමග ඉදිරිපත් කළ යුතු අතර, එය කොමසාරිස් ජෙනරාල්වරයාට පක්ෂව ලියා ඇති පළමු ඉල්ලීම මත මුදල් කළ හැකිය. ලංසු සුරක්ෂණය **2025.09.19 සිට 2026.01.01** දක්වා වලංගු විය යුතුය. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ සරප් වෙත ආපසු ගෙවිය හැකි තැන්පතුවක් ද තැබිය හැක.

08. තෝරාගන්නා ලංසුකරු **2025 නොවැම්බර් 01 දින** සිට සේවාව ආරම්භ කළ යුතුය.

09. ලංසු ඉදිරිපත් කිරීමකට පෙර, අදාළ ස්ථාන නිරීක්ෂණය කරන්න.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව,**
**12 වන මහල, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර,**
**බත්තරමුල්ල.**

SELACINE